# ශ්‍රී ලංකාවේ කුල ස්ථරායනය ආර්ථික සාධකය මත සමාජ ගත වීද යන්න පිළිබඳව සමාජ මානව විද්‍යාත්මක අධ්‍යයනයන්

ටී. ජී. ඩී. උදයකාන්ති

තාවකාලික කථිකාචාර්ය, සමාජීය විද්‍යා අධ්‍යයන අංශය,
සමාජීය හා මානවශාස්ත්‍ර පීඨය, රජරට විශ්වවිද්‍යාලය
deepikagamage56@yahoo.com

## හැඳින්වීම

ලොව කුමන සමාජයක වුව ද සමාජ වරප්‍රසාද සහ අයිතිවාසිකම් භුක්ති විඳින ආකාරය අනුව ජාති ආගම් කුල හා ජීව විද්‍යාත්මක සාධක මත සමාජ ව්‍යුහය ස්ථර ගත වීමත් දක්නට ඇත. එය කෘත්‍යවාදින්ට අනුව සමාජ පැවැත්මට දායක වුව ද මාක්ස් හා වෙබර්වාදින්ට අනුව ස්ථරායනය යන්න ආර්ථික සාධකය මත සමාජය සුරා කෑමට ගත් උපක්‍රමය කි.

ලංකාවේ සමාජ ස්ථරායනය තුල විශේෂ වන කුලය පිළිබඳ බටහිර සමාජ විද්‍යාඥයින්ගේ පවා අවධානය යොමු විය. ක්‍රි.පු 6වන සියවසටත් වඩා ඈතට දිව යන මෙම කුල ක්‍රමයට ඉන්දීය ආභාෂය ද ලද බවට සාධක ඇත.

කුලය ආරෝපිත තත්වයකි. එය සමාජ ක්‍රමය ධූරාවලි ගත වීමට හේතු විය යන්න ඒ. එල් ක්‍රෝබර් (A.L Kroeber ) සඳහන් කරයි. ඊ. ආර් ලීච් (E.R Leach) සහ හටන්ට (Hutten) අනුව ආර්ථික සාධකය මත කුලය ලංකාව තුල තහවුරු වූ බව සඳහන් කරයි. ලංකීය කුල ක්‍රමය පිළිබඳ අධ්‍යයනය කළ සමාජ විද්‍යාඥයින් ලෙස රැල්ෆ් පීරිස් නූර්යාල්මාන්, ඊ. ආර් ලීච් සඳහන් කල හැකි ය. එය වැඩවසම් සමාජ ක්‍රමය පෝෂණය කළ සමාජ ආයතනය කි.

## ගැටළුව

කුල ක්‍රමය ගත් විට එය බොහෝ විට ආසියාතික කලාපවල දක්නට ලැබේ. ඉන්දීය කුල ක්‍රමය ගත් විට එය ස්ථාපිත වී තහවුරු වීමට ආගමික පසුබිම බලපෑව ද ලංකීය කුල ක්‍රමය ස්ථාපිත වීමට බලපෑ සාධක නිශ්චිත නොවේ. නමුත් ඓතිහාසික සාක්ෂි සලකා බැලීමේදී පැහැදිලි වන්නේ එය ස්ථාපිත වීම සඳහා ආර්ථිකය බලපෑම් කල බවයි. ඒ අනුව ලංකාවේ කුල ක්‍රමය ස්ථාපිත වීමට ආර්ථික සාධකය බලපෑම් කරන ලද්දේ ද ? යන ගැටළුව සම්බන්ධව මෙහිදී අධ්‍යයනය කරන ලදී.

## අරමුණ

ලාංකිය කුල ක්‍රමයේ ස්ථාපිත පසුබිම සම්බන්ධව නිශ්චිත පසුබිමක් නැත. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ කුල ස්ථරායනය ආර්ථික සාධකය මත සමාජ ගත වීද එහි සමාජීය බලපෑම කුමක් ද යන්න අධ්‍යයනය කිරීම යි. මීට අමතරව වර්තමානය වන විට එහි වෙනස්වීම් හා සමාජ වැදගත්කම සාකච්ඡා කරන ලදී.

## පර්යේෂණයේ වැදගත්කම

කුලය පිළිබඳ කෘත්‍යාත්මක වැදගත්කම පිළිබඳ හඳුනාගැනීමටත් මීට අමතරව එහි ශක්තීන් හා දුර්වලතා පිළිබඳවත් එහි සමාජීය වටිනාකම පිළිබඳවත් හිඳුනාගත හැකි අතර එය රටක ආර්ථික ව්‍යුහයේ ස්ථාවරත්වයට සිදු කරන බලපෑම පැහැදිලි කරන ලදී.

## පර්යේෂණ ක්‍රමවේදය

ලාංකීය කුල ක්‍රමයේ ස්ථාපිත පදනම සම්බන්ධව අධ්‍යයනය කිරීමේදී සුදුසුම ක්‍රමවේදය වන්නේ ඓතිහාසික ක්‍රමයකි (Historical Method) එම එම ක්‍රමවේදය

අනුගමනය කරමින් ඓතිහාසික මූලාශ්‍ර පදනම් කර ගනිමින් සෙල්ලිපි, සාහිත්‍ය ග්‍රන්ථ ද විදේශිකයන්ගේ වාර්තා ද සාහිත්‍ය ග්‍රන්ථ යටතේ ආගමික ග්‍රන්ථ වන පූජාවලිය සහ සද්ධර්මරත්නාවලිය ද සාහිත්‍ය මූලාශ්‍ර වන පරවි සංදේශය, සැලළිහිණි සංදේශය ද, සමාජ තොරතුරු සඳහන් කෘතිවන මහාවංශය, ජනවංශය, නීති නිඝණ්ඩුව ආදිය ද පාදක කරගනිමින් අධ්‍යයනය සිදු කරන ලදී.

පර්යේෂණ ක්‍රමවේදය තුළ වර්ගීකරණය කරන ලද මූලාශ්‍ර පදනම් කර ගනිමින් කුලය පදනම් කර ගත් ලාංකීය ඓතිහාසික සමාජය පිළිබඳව අධ්‍යයනය කරන ලදී.

## දත්ත විශ්ලේෂණය

සිංහල කුල ක්‍රමය කවදා කෙසේ ආරම්භ වීද යන්න නිශ්චිතව ප්‍රකාශ කළ නොහැක. එය හින්දු කුල ක්‍රමයේ ආභාෂයෙන් නිර්මිතයක් ලෙස ඉතිහාසඥයින් සිදහන් කරයි. ක්‍රි. පූ 5 වන සියවසේ ලංකාවට පැමිණි ආර්‍යයන් ඉන්දිය ආභාෂය මෙරට ස්ථාපිත කළ බව පැහැදිලි ය. "හේම එල්ලාවලයන්" රචිත "පුරාතන ලංකාවේ සමාජ ඉතිහාසය " කෘතියට අනුව බ්‍රාහ්මන හෙවත් උගත් පන්ති ක්ෂත්‍රිය හෙවත් පාලක පංතිය ගහපති (වෛශ්‍යය) හෙවත් ගොවීන් හා වෙළඳුන්ගෙන් යුතු පංතිය ශුද්‍ර හෙවත් පහත් මෙහෙයන් ගෙන්'යුතු පංතිය ශුද්‍ර හෙවත් පහත් මෙහෙයන් ලෙස පුද්ගල වර්ගීකරණයක් සමාජගත වූ බව සිදහන්කරයි.

මහින්දාගමනයෙන පසුව සංඝමිත් තෙරණිය සමග රටට පැමිණි ශිල්ප ශ්‍රේණි ඔවුන්ගේ ශිල්පීය ක්‍රමවේදයන් සමග සමාජ ගත විය. ප්‍රාග් බෞද්ධ යුගය තුළ පැවති සමාජ බෙදීම (යක්ෂ/ නාග/ගෝත්‍ර) පසුකාලීනව කුල වලට අනුගත වන්නට ඇතැයි සිතිය හැකිය.

කුල ක්‍රමය පිළිබඳ මිහිඳුගේ පුවරු ලිපියේ සෙල් ලිපි තුළ සිදහන් අයුරින් "සිරිබර කැත කුල" යනු ක්ෂත්‍රිය කුලය යි. මිහින්තලය සිවුවන මිහිඳුගේ පුවරු ලිපිය තුළ ද ආරාම පාලනයේදී යම් බෙදීමක් තිබූ බව සඳහන් ය. මෙම කුල ක්‍රමය නොවූවා විය හැකි නමුත් කුල ක්‍රමයට යම් පදනමක් වී ඇතැයි සිතිය හැකි ය.

ඓතිහාසික මූලාශ්‍ර වන මහාවංශය, නීති නිඝණ්ඩුව, මහාවංශය තුල කුලය ආර්ථික සාධකයක් මත විශේෂීකරණය වූ ශ්‍රම විභජන පද්ධතියක් ලෙස සඳහන් කළ හැකි ය. ජනවංශය සඳහන්කරන පරිදි වැඩවසම් නිෂ්පාදන රටාව තුල රදළ පංතියේ අවශ්‍යතා වෙනුවෙන් ද සකස් විය. මධ්‍යකාලීන සිංහල කලා කෘතිය රචිත ආනන්ද කුමාරස්වාමි හා මෙරට පැරණි සමාජය විවරණය කළ ඩේවි විසින් ද උක්ත කරුණු පසක් කරන ලදී.

ඒ අනුව සාහිත්‍ය මූලාශ්‍ර වල ද කුලය පැවති බවට සාධක ඇත. සැලළිහිණි සංදේශය, පරවි සංදේශය වැනි සංදේශ කාව්‍ය වලත් පූජාවලිය, සද්ධර්මරත්නාවලිය, වැනි කෘති තුලත් කුලය පැවති බව සඳහන් වේ.

මේ අනුව සිංහල කුල ක්‍රමය රැකී රක්ෂා පදනම අනුව සකස් විය. ඒ ඒ කුල වලට අයත්වූ වෘත්තීය නිපුනතා මත අනිවාර්ය සේවය සැපයූ අතර මහනුවර යුගය වන විට මෙම තත්වය නීත්‍යානුකූල විය. යටත් විජිත පාලන සමය තුල කුලය මුල්කාලීනව සමාජ පාලනයේ පහසුවට යොදා ගත්ත ද රාජකාරි ක්‍රමය අහෝසිවීම තුල එය ක්‍රමයෙන් ක්ෂය වෙමින් පවතියි පෘතුග්‍රීසි, ලන්දේසී, යුගය තුල පහළ කුල උඩුකුරු චලනතාවයක් ලබා ගනිමින් ආර්ථිකය තහවුරු කරගෙන ඇත.

## නිගමන

සිංහල කුල ක්‍රමය ඉන්දීය ආභාෂය ලැබූ නමුත් එය ඒ ආකාරයෙන්ම ලංකාව තුල ස්ථාපිත නොවූ අතර ආරෝපිත සමාජ ආයතනයක් වුව ද ලංකාව තුල නම්‍යශිලි විය. මෙම ධූරාවලි ක්‍රමය වැඩවසම් සමාජ ක්‍රමය තුල ශ්‍රම විභජනය හා විශේෂීකරණය තුල සාර්ථක නිෂ්පාදන ක්‍රමවේදයකට දායක වුව ද පාලක රදළ පංතිය තම බලය සංකේතවත් කිරීමට යම් යම් සමාජ වරප්‍රසාද ආරෝපනය කරමින් උසස් හා පහත ලෙස කුල වර්ගීකරණය කරන ලදී. මෙය කාල්මාක්ස් ඉදිරිපත් කළ ආර්ථික නියතිවාදය ක්‍රියායයට නැංවූ අවස්ථාවකි. මාකස් වෙබර්ගේ ධූරාවලී ක්‍රමය තුල දක්නට ඇති අතර ඒ තුල ඉහල කුල වල පීඩනයට සහ සූරාකෑමට පහළ කුල නතු වේ. උක්ත කරුණු විශ්ලේෂණය තුලින් ප්‍රධාන වශයෙන් එළඹිය හැකි නිගමනය වන්නේ ලංකාව තුල

කුල ක්‍රමය ස්ථාපිත වී ඇත්තේ ආර්ථික සාධකය හේතු කොට ගෙන යන්නයි.

## ආශ්‍රය ග්‍රන්ථ


ආරියපාල එම්. බී ජයවික්‍රම එන්. සී විජේසූරිය. විමල. කුරේ. චන්දන සංස්: (2003) ජනවංශය ඇස් ගොඩගේ සහ සහෝදරයෝ. කොළඹ 10

ඔබේසේකර, මීරෙන්ඩෝ අභිනන්දනීය ශාස්ත්‍රිය සංග්‍රහය, ශ්‍රී ලංකාවේ කුල සංයුතිය ( 2010) සංස්කෘතික සංවර්ධන සංවිධානය.

කිරි ඇල්ලේ ඥාණවිමල හිමි. සංස්: සද්ධර්මලංකාරය, කොළඹ

චාල්ස්, හෙන්රි, (පරිවර්තනය: අල්විස් ඊ. ප්‍රේමචන්ද්‍ර 2004, ලංකාව හා සිංහලයෝ, සූරිය ප්‍රකාශකයෝ: මරදාන

ජයවර්ධන කුමාරි (2006) සොක්කත් ලොක්කත් වූ විගයි. සමාජ විද්‍යාඥයින්ගේ සංගමය කොළඹ 05

පීරිස්,රැල්ෆ්, (2001) සිංහල සමාජ සංවිධානය, සී/ස (පෞද්) විසිදුනු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව

මුදියන්සේ, නන්දසේන ( 2000) සිංහල ශිලාලේඛන සංග්‍රහය, එස් ගොඩගේ සහ සහෝදරයෝ

රූබේරු, ටී. කේ ( 2003) ප්‍රතිකාල් ජාතික රිබෙයිරෝගේ ලංකා ඉතිහාසය, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ : කොළඹ 10

විජයතුංග, හරිස්චන්ද්‍ර ( 1998) නීති නිසණ්ඩුම, එස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10

ශ්‍රී සුමංගල නායක මාහිමි, දෙවරක්ෂිත, බටුවන්තුඩාවේ( 1996) මහාවංශය සිංහල (ප්‍රථම හා දෙවන භාගය) එස් ගොඩගේ සහ සහෝදරයෝ: මරදාන